ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයට අයත් ඉඩම හෙක්ටයාර් 10.0229 ක් වුවද,හෙක්ටයාර් 9.8047 කප්‍රමාණයක් පමණක් රු.4,845,500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබූ අතර හෙක්ටයාර් 0.2182 ක ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	ඉඩමට අදාල මිනුම් කටයුතු කිරීම සඳහා ඉල්ලීම් මහරගම ප්‍රාදේශීය ලේකම් වෙත හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව හා ඉඩමේ සම්පූර්ණ පවරා ගැනීම් නිම වූ පසු ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව.	සම්පූර්ණ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	භාවිතයට ගැනීමට නුසුදුසුඅවසන් තොගය තුල ඇතුලත් රු. 3,392,723 ක්වූ තොග මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ කර ගැනීමට කටයුතු කරන බව.	අවසන් තොගය තුල ඇතුළත් භාවිතයට ගැනීමට නොහැකි තොගය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, පූජ්‍ය පක්ෂයට හා වෙනත් නිදහස් කිරීම් වලට අදාල බිල්පත්වලමුළු එකතුව සිස්ටොලික් (Systolic) පද්ධතිය අනුව රු.329,951,830 ක් වුවත් එය රු.301,595,862 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලාභය රු.28,355,968 කින් වැඩි වී තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන වල වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මණ්ඩලයේ නේවාසික රෝගීන්ගේ තැන්පතු මුදල බැර ශේෂයක් විය යුතු වුවත් ආදායම් පාලන ගිණුමේ එය රු.28,223,907 ක හර	2025 වර්ෂයේදී සියලුම තුලනය කිරීම් අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව.	මූල්‍ය ප්‍රකාශනවල හා අදාල ලෙජර් ගිණුම තුල වරද

	ශේෂයක් ලෙස දක්වා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් වලින් අඩු කර දක්වා තිබුණි.		නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	බැංකු සැසඳුම්හි පැවති හඳුනා නොගත් තැන්පතු රු.7,392,471ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට රු.5,347,692 ක ප්‍රමාණයක් හඳුනාගෙන ගිණුම්ගත කර ඇති බවත් ඉතිරිය හැකි ඉක්මනින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	හඳුනා නොගත් මුළු තැන්පතු වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2024 දෙසැම්බර් මාසයට අදාලව පිරිසිදු කිරීමේ හා රෝහල් උද්‍යාන සේවාව සඳහා ගෙවිය යුතු ශේෂය රු.8,183,726 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,242,747 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.5,940,979 කින් ලාභය වැඩි වී උපචිත වියදම් එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.	ගෙවිය යුතු වටිනාකම නිවැරදිව හඳුනා ගැනීම සිදුකර නොතිබූ බැවින් ගිණුම්ගත වීම සිදුවී නොමැති බව හා 2025 මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ සේවය හැර ගිය වෛද්‍යවරයෙකුගෙන් අය විය යුතු බැඳුම්කර ගාස්තුව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු බැඳුම්කර ශේෂය රු.660,175 කින් හා ගිවිසුම් කඩ කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් ලද බැඳුම්කර ගාස්තු, වර්ෂයේ ආදායමට නොගෙන වියදම් ගිණුම් වලට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම රු.2,862,288 කින් අඩු වී තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඌ)	වත්කම් ලෙස ගිණුම් ගත කල යුතු රු.2,426,677ක් පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා වත්කම් එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.	-එම-	මූල්‍ය ප්‍රකාශනවල හා අදාල ලෙජර් ගිණුම්වල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	වෙනත් මෙහෙයුම් වියදම් යටතේ සැපයුම්කරුවන් සමග අත්සන් කර ඇති සේවා ගිවිසුම් හා වෙනත් වියදම් තුල පවතින 2022 හා 2023 වර්ෂ වලට අදාල රු.14,880,821 ක හා රු.137,914 ක වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල වියදමක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.15,018,735 කින් අඩුවී තිබුණි.	2023 වසරේ නිවැරදිව ගිණුම් ගත කර නොතිබූ බව.	වර්ෂයේ ලාභය/ අලාභය ගණනය කිරීමේ දී සමාලෝචිත වර්ෂයට අදාල වියදම් පමණක් සැලකිල්ලට ගත යුතුය.

(ඒ)	මිලදී ගැනීම් වලට අදාළ භාණ්ඩ මණ්ඩලයට නොලැබී තිබියදී සම්පූර්ණ මුදල් ගෙවීම මගින් ඉදිරියට කල ගෙවීම් හර කිරීම වෙනුවට ණය හිමි ශේෂය හර කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ණයහිමි ශේෂය රු. 3,289,557කින් අඩු වී තිබුණි.	භාණ්ඩ ලැබී භාණ්ඩ ලැබීම් පත්‍ර (GRN) ඇතුලත් කලපසු අදාල ගැලපීම් සිදුකිරීමට නොහැකි වන බැවින් හා අත්තිකාරම් දැනට ගෙවා ඇති බැවින් එම ශේෂයන් ණයගැතියන් යටතේ ඇතුලත් කල බව.	මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය
(ඔ)	උපචිත වියදම්යටතේ දැක්විය යුතුරු. 1,292,674 ක්දක්වා නොතිබීම හේතුවෙන් එකතු කළ අගය මත බදු (VAT) වගකීමඑම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.	වරද නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන වල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඕ)	වැඩ බිම් ගොඩනැගිල්ල ඉදි කිරීමටඅදාල වැඩපූර්ව අත්තිකාරම් රු. 7,106,554ක් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දිනට එහි ශේෂය රු.5,955,191ක් වූ බැවින් රු. 1,151,363ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	-එම-
(ක)	සැපයුම්කරුවන් සමග අත්සන් කර ඇති සේවා ගිවිසුම් වියදම රු.2,441,897ක් වුවත් එය රු.3,550,488ක් ලෙස දැක්වීම නිවැරදි කිරීමට එහි වෙනස වූ රු.1,108,591ක් ඉකුත් ගෙවීම් විවිධ ණය ගැති ලෙස දැක්වීම හේතුවෙන් උපචිත වියදම් හා විවිධ ණය ගැතියෝ එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි.	2024 වර්ෂය සඳහා වියදම් උපචිත කිරීමේ දී මුළු මුදලම උපචිත වියදම් ගිණුමට බැර කර අදාළ වියදම් ගිණුම හර කර ඇති අතර මුළු වටිනාකමෙන් 2025 වර්ෂයට අදාළ රු.1,209,254 ක මුදලක් ඇතුළත් වී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	-එම-
(ග)	2016 සහ 2017 වර්ෂවල සිට පැවත එන රු.1,816,132 ක ගෙවිය යුතු පාරිතෝෂික වෙනත් වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	දීර්ඝ කාලීනව පවත්නා ශේෂයන් වන අතර 2025 වර්ෂයේදී නැවත වරක් ගිණුම් පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වගකීම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට හා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.

1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති ලෙජරයේ ශේෂය රු.993,098,036 ක් වුවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද ණයගැති උප ලේඛණය අනුව එම ශේෂය රු.1,056,038,283ක් විය. ඒ අනුව රු.62,940,247 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම වෙනස්කම් වලට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයට පෙර සේවය අතහැර ගොස් තිබුණු හෙද නිලධාරින් 23 දෙනෙකුගෙන් අයවිය යුතු රු.37,617,947 ක් වටිනාකම ඇති බැඳුම්කර වසර 01 ත් 06ත් අතර කාලයක් ගත වී තිබුණද මේ දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හෙද නිලධාරින් 09 දෙනෙකු රු.10,809,686 ක්ගෙවීම් ආරම්භ කර ඇති අතර ඉතිරි මුදල් අය කර ගැනිමට නිතීමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා නිතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සේවය අත්හිටවූ, සේවය අතහැර ගිය, විදේශගත වූ හා මිය ගිය සේවකයන්ගෙන් අයවිය යුතු එකතුව රු.6,077,633 ක්වූ ආපදා ණය ශේෂය මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම මුදලින් රු.4,776,425 ක් වර්ෂ 02 සිට 11 දක්වා කාලයක සිට අයවිය යුතු ශේෂ විය.	සේවකයින් 20 දෙදෙනෙකුගෙන් ණය මුදල් අයකර ගනිමින් පවතින බවත්, ඉතිරි 11 දෙනා සඳහා ණය මුදල ගෙවන ලෙසට දැනුම් දී තවදුරටත් ණය ගෙවීම පැහැර හරින්නේනම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවටත් දැනුවත් කර ඇති බව.	-එම-
(ඇ)	2023 වර්ෂයේ සුළු මුදල් අග්‍රිමය ශුන්‍ය කිරීම සඳහා යොදන ලද ජ'නල් සටහනක් හේතුවෙන් හටගත් රු.100,100 ක විවිධ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් නිරවුල් කර නොතිබුණි.	නැවත වරක් ගිණුම් පරීක්ෂා කර 2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017අංක 04දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ	ශ්‍රීලංකාවේ ඉංජිනේරු කාර්යයන් කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරුසංගමයේ ලියාපදිංචිය	ජීව වෛද්‍ය ඉංජිනේරුවරිය වෙත ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමයේ ලියාපදිංචිය ඉදිරිපත් කරන ලෙස	සුදුසුකම් පිළිබඳ තහවුරු කර ගැනීමෙන්

	සභාව පනතේ 14 වගන්තිය	ලබා ගැනීම අවශ්‍ය වුවද, එසේ ලියාපදිංචිය ලබා නොගත් නිළධාරියකුමණ්ඩලයේ ජීව වෛද්‍ය ඉංජිනේරු ලෙස බඳවා ගෙන SL 1 වැටුප් පරිමාණයේ iii ශ්‍රේණියටඅදාළ වැටුප ගෙවා තිබුණි.	දන්වා ඇති බව.	අනතුරුව බඳවා ගැනීම් සිදු කල යුතුය.
(ආ)	2009 මැයි 14 දිනැති අංක අමප/09/0675/311/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතනවල රෝගීන් සහ සේවකයින් සඳහා මාළු සහ කරවල සැපයීමේ කොන්ත්‍රාත්තුව ලංකා ධීවර සංස්ථාවට ලබාදිය යුතුබවට අනුමැතිය ලබා දී තිබුණද,එයට පටහැනිව ප්‍රසම්පාදන කමිටුව විසින් ඒ සඳහා ලංසු කැඳවා පෞද්ගලික සැපයුම්කරුවෙකු වෙත 2023/ 2024 වර්ෂ හා 2024 මාස 03 ක් සඳහා පිළිවෙලින් රු.45,009,480 කට හා රු.6,630,930 කටකොන්ත්‍රාත්තුවලබා දී තිබුණි.	මීට පෙර අවස්ථා කිහිපයකදී එම සංදේශය පදනම් කර ධීවර සංස්ථාවට ලබා දී තිබූ අතර සැපයුම් කිරීමේ දී සිදු වූ ගැටළුකාරී තත්ත්වයන් මත තරඟකාරී මිල කැඳවීම සිදු කර ඇති බව හා 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කරන බව.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කල යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 (2) හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020	මාණ්ඩලික නොවන නිලධාරීන් 8 දෙනෙකු සඳහා අවස්ථා 58 කදී රු.25,000 ඉක්මවා රු. 2,628,090 ක් සුළු මුදල් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි.	2025 වර්ෂයේදී මුදල් රෙගුලාසි 371 අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය.
(ඈ)	2015 මැයි 28 දිනැති අංක 01–21/2015 දරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛය	අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් වෛද්‍ය ආයතනවල රෝගීන්ට සහ කණිෂ්ඨ සේවකයින්හට පමණක් රෝහල විසින් ආහාර සැපයීම සිදුකළ හැකි වුවත් ඉන් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 242:15 මගින් රෝහලේ කණිෂ්ඨ සේවකයින් නොවන අනෙකුත් සේවා කාණ්ඩවල නිලධාරීන් සඳහාද එක් වේලක් (දිවා ආහාරය) සඳහා රු.60 ක මුදලක් අයකර ආහාර සැපයීම සිදුකර තිබුණි.	රෝහලේ කළමනාකරණ මණ්ඩලය රෝහල් කාර්ය මණ්ඩලයේ ඉල්ලීම් සලකා බලා මෙම දිවා ආහාරය ලබා දීමට තීරණය කර ඇති බව	අදාල චක්‍රලේඛ වලට අනුගත විය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 552.43 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 303.77 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 248.66 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු. මිලියන 150.81 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුගතව ආදායම් ලෙස සැලකීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබීමට පෙර ගැණුම් ඇණවුම නිකුත් කර රු.651,960 ක් වටිනා වර්ණ රූපවාහිනී 04 ක් මිලදීගෙන තිබූ අතර ඉන් දෙකක් මේ දක්වාම භාවිතයට නොගෙන ගබඩාව තුල රඳවා තිබුණි.	රූපවාහිනී යන්ත්‍ර සවිකිරීමට බලාපොරොත්තු වන කාමර දෙක අලුත්වැඩියා කිරීමෙන් පසු සවි කිරීමට බලාපොරොත්තු වන බව.	නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව මිලදී ගැනීම් කළ යුතුය.
(ආ)	විෂය පිළිබඳ දැනුමක් සහිත නිලධාරියෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත් නොකර රු.16,225,000 ක් වටිනා වෙනස් කල හැකි රෝගී ඇඳන් හා මෙට්ට (Adjustable Patien Bed with Mattress) 50 ක් මිලදී ගෙන තිබුණද, ඇඳන් 40 ක් පමණක් සැපයුම්කරු විසින් සපයා තිබුණි. සපයා තිබූ ඇඳන්ද විවිධ දෝෂ හේතුවෙන් පාවිච්චියට ගැනීමට නොහැකි වී තිබුණි.	දෝෂ සැපයුම්කරු වෙත දන්වා නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බවත්, අදාල ඇඳන් සඳහා අමතර වගකීම් කාලයක්ද ලබාගෙන ඇති බවත්, අවශ්‍ය අමතර කොටස් ලබා ගැනීමට ද කටයුතු කර ඇති බව හා ඒ අනුව රෝහලට මූල්‍යමය අලාභයක් සිදු නොවීමට වග බලා ගෙන ඇති බව.	නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමවේදය භාවිතා කර ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ මිලදීගැනීම සිදු කළ යුතුය.
(ඇ)	2023 වර්ෂයේදී Ceftriaxone 1g injection නම්ඖෂධයෙන් ඒකක 35,700 ක් රු.400 බැගින් රු.13,080,000 කට මිලදී ගැනීමට ගැණුම් ඇණවුම් හා ප්‍රතිග්‍රහණ ලිපි අදාල සැපයුම්කරුට ලබා දී තිබුණද, 2023, 2024 හා 2025 වර්ෂයන්හි පිළිවෙලින්ඒකක 3,000 ක්, 13,000 ක් හා 14,000 ක් ලැබී තිබූ අතර වටිනාකමරු.2,280,000ක් වූ ඒකක 5,700 ක් මෙම වාර්තාවේ දිනය වන තෙක් ලබාගෙන නොතිබුණි. වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය නොකිරීම හේතුවෙන් දීර්ඝ කාලයක් එකම ඇණවුම ක්‍රියාත්මක වීමෙන් තරඟකාරී අඩු මිලකට මිලදී ගැනීමේ අවස්ථා අහිමි වී තිබුණි.	අදාලඖෂධතොග,සැපයුම්කරු සතුව නොමැතිවීම නිසා නියමිත කාලසීමාව තුළ සැපයීමට සැපයුම්කරු අපොහොසත් වී ඇති බවත්, පසු කාලීනව එම තොගය සැපයුවද ඒ වන විට Ceftriaxone නික්ෂේපණයට අදාලව අසාත්මිකතා බහුලව වාර්තාවීම නිසා භාවිතය ශීඝ්‍ර ලෙස පහත වැටී තිබුණු බවත්, ඒ හේතුවෙන් කුප්පි 3000 ක් පමණක් භාරගෙන ඇති බව හා එදින සිට අද දක්වාම	වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය කල යුතුය.

	නොකඩවා රෝහලේ අවශ්‍යතාවය පරිදි අදාල සැපයුම්කරුගෙන් ඒවා ලබා ගෙන ඇති බව හා පසුගිය වසර දෙක තුළ රෝහලට පත් වූ සභාපතිවරුන්ගේ තීරණය වූයේ රාජ්‍ය ඖෂධ ගබඩාවෙහි නොමැති ඖෂධ පමණක් පිටතින් මිලදී ගත යුතු බවය.	

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 වර්ෂයේ සිට නිශ්චිත පදනමකින් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව ඇතැම් රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් නිදහස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට එසේ නිදහස් කළ බිල්පත් වල එකතු වටිනාකම රු.29,009,042 ක් විය.2017 වර්ෂය තුළ බැරපත් මගින් එකතුව රු.6,401,023 ක මුදලක් ඉවත් කර තිබුණද ඊට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	පරීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව.	ගාස්තු නිදහස් කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.
(ආ)	2016 සිට 2024 වර්ෂය දක්වා බිල්පත් නොගෙවා රෝහලින් බැහැරවූ රෝගීන්ගෙන් රු.24,306,197ක් මේ දක්වා අය කරගෙන නොතිබුණි.	ශේෂයන් තුළ වැඩි අගයන් පෙන්වන්නේ කොවිඩ් 19 කාලසීමාව තුළ රෝහලට ඇතුළත් වූ රෝගීන්ගෙන් අයවිය යුතු ශේෂයන් බව හා ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබා ගැනීමට කටයුතු කරන බවත්.	අය විය යුතු රෝහල් ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	බැහැරව ගිය රෝගීන්ගේ බිල්පත් වෙනුවෙන් රක්ෂණ ආයතන හා සේවා ආයතන 10 කින් ප්‍රතිපූර්ණය නොවූ රු. මිලියනය ඉක්මවූ දින 90 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.43,453,787 ක ණයගැති ශේෂයක් විය.	ශේෂ අයකර ගනිමින් පවතින අතර මේ වන විටත් එය රුපියල් මිලියන 18 කට අඩු කර ඇති බව.	මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මණ්ඩලයේ පවත්වනු ලබන රසායනාගාර පර්යේෂණ මිල ගණන්වල පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කිරීමකින් තොරව සංශෝධනයකර තිබූ අතර කරන ලද නියැදි පරීක්ෂාවට අනුව රෝහලට අහිමි වූ ආදායම රු.9,563,000ක් වී තිබුණි.	2024 සැප්තැම්බර් මාසයේදී රසායනාගාර පරීක්ෂණ ගාස්තු සංශෝධනය කිරීම විනිවිද භාවයක් නොමැතිව සිදු කර ඇති බව හා මේ වන විට නැවත වරක් මෙය නිවැරදි කර ඇති බව.	මිල ගණන් සංශෝධනය කිරීමේදී රෝහලට අලාභයක් සිදු නොවන ආකාරයට සිදු කළ යුතුය.
(ඉ)	මණ්ඩලයේ සාමාන්‍ය හා ගෙවන වාට්ටු වලට ඇතුළු වන රෝගීන් සඳහා හදිසි ඖෂධ දේශීයව මිලදී	පෙන්වා දී ඇති බිල්පත් සම්බන්ධයෙන් නැවත පරීක්ෂාකර	බිල්පත් සැකසීමේදී නිසි

	ගැනීමේදී හා බිල්පත් සැකසීමේදී පිළිවෙලින් සියයට 10 ක් හා 30 ක් ලෙස ලාභ ආන්තිකයක් පවත්වා ගත යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවේදී සාමාන්‍ය වාට්ටුවල රු.5,976,775 ක වටිනාකම ඇති බිල්පත් 18 ක සියයට 49 ත් 767 ත් අතර ලාභ ආන්තිකයක්ද, ගෙවන වාට්ටුවල රු.35,983,650 ක වටිනාකම ඇති බිල්පත් 21 ක සියයට 30 ත් 422 ත් අතර ලාභ ආන්තිකයක්ද පවත්වාගෙන ගොස් තිබුණි.	පිළිතුරක් ලබාදීමට අපේක්ෂා කරන බව.	ක්‍රමවේදයක් පවත්වා ගත යුතුය.
(ඊ)	විදුලි හා ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩාවේ වසර 9 කට පෙර සිට පවතින භාවිතයට නොගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය (Building Items) හා විදුලි භාණ්ඩ(Electrical Items) වටිනාකම පිළිවෙලින් රු.1,612,549 ක් හාරු.3,984,022 ක් විය. තවද, මෙම ගබඩාවට අයත් කන්ටේනර් පෙට්ටියක් තුළ විවිධ වර්ගයේ යකඩ තොගයක් 2022 වර්ෂයේ සිට පවතින අතර එම යකඩ මළ බැඳීම හේතුවෙන් දිරාපත් වීමේ අවධානමක් පැවතුණි. මෙම යකඩ තොග භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	විදුලි අංශයෙහි Generator කාමරයක් සැකසීම සඳහා ඇනවුම් කලද එම කාර්ය අරඹා නොමැති බව හා එය අපහරණ කමිටුවට ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති බව.	මෙම යකඩ තොග හැකි ඉක්මනින් භාවිතයට ගැනීම හෝ භාවිතයටගත නොහැකිනම් අපහරණය කිරීමට කටයුතු කල යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂය තුල රු.101,214,000 ක මුදලක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබූ අතර, වර්ෂය තුල එම මුදලින් වැය කල ප්‍රමාණය රු.37,747,483 ක් විය. ආරම්භක ශේෂයද ඇතුළුව ඉතිරි රු.63,505,607 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී නැවත මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබූ රු.26,898,606 ක් හා රු.36,607,000 ක් මාස තුනක කාලයක් හා මාස දෙකහමාරක කාලයක් බැංකු ගිණුමේ නිෂ්කාර්යව රඳවා තිබුණි.	රෝහලේ ගෙවන කාමර 50ක් සෑදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියද ආරම්භ වී තිබුණද, එහි පැවති යම් යම් අසම්පූර්ණතා සහ ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ බව.	ව්‍යාපෘති නිසි ලෙස සැලසුම් කර ආරම්භ කළ යුතුය.
(ඌ)	මණ්ඩලයේ පවතින රෝහල් ගාස්තු බිල්පත් හා තොග සම්බන්ධ (Systolic)පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට (Accpack) ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම හේතුවෙන් පද්ධතිය තුළ පවතින ගැනුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්හි අගයන් වෙනස්වීම මෙන්ම එකම පද්ධතිය තුළ (Systolic) වෙනස් දිනයන්හි ශේෂ වෙනස්වීම් නිරීක්ෂණය වූයෙන් එම අයිතමයන්හි නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලින්නිරූපනය වන්නේද යන්න පිළිබඳ විගණනයේදීතහවුරු කර ගැනීමට නොහැකි විය. මණ්ඩලයේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම, පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතු වී තිබුණි.	වර්තමානය වන විට Systolic පද්ධතිය හා ගිණුම්කරණ (Acc Pack) පද්ධතියෙහි ආදායම එනම් දෛනික මුදල් අයකැම් වාර්තා (Cashier Session) හා ණයවර ලිපි (Credit Letters) ස්වයංක්‍රීයකරණය කර ඇති අතර ඉදිරියේදී ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමෙන් අනතුරුව පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණයකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	පරිගණක පද්ධති දෙක අතර නිවැරදි සම්බන්ධතාවය ක් ඇති කළ යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තනතුරු වර්ග දෙකක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 208 දෙනෙකු හා අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු වර්ග දෙකක් සඳහා නිලධාරීන් 140 දෙනෙකු බඳවාගෙන තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ අමාත්‍යතුමාගේ මග පෙන්වීම මත මෙසේ කටයුතු කර ඇති බව හා එවකට සිටි සභාපතිතුමාගේ සෘජු නියෝගය අනුව සිදුකළ බව.	අනුමත වි ඇති තනතුරු වර්ග හා සංඛ්‍යාව ඇතුළත බඳවා ගැනීම් සිදු කළ යුතුය.
(ආ)	මණ්ඩලයේ පවතින විවිධ තනතුරු සඳහා නව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර රෝහලේ MN 1 වැටුප් කාණ්ඩයේ සිටින නිලධාරීන් 58 දෙනෙක් වෙනුවෙන් MN 2 වැටුප් තලයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) මගින් රු.865,905 ක වියදමක් දරා පුහුණුවක් හා විභාගයක් පවත්වා තිබුණද, MN 2 වැටුප් තලයේ පිහිටුවීමට නොහැකි වී තිබුණි.	නිලධාරීන් MN1 සිට MN2 වැටුප් තලයට පත් කිරීමට නොහැකි වී ඇති බව.	බඳවා ගැනීමේ පටිපාටිය කඩිනමින් අනුමත කර ගත යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයට බඳවා ගන්නා ලද කළමනාකරණ සහකාර, රියදුරු හා සෞඛ්‍ය කාර්ය සහයක තනතුරු 149 ක් සඳහා ප්‍රසිද්ධ දැන්වීම් පලකර අයදුම්පත් කැඳවීමෙන් තොරව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් ලිපි නිකුත් කිරීම් හා එය පැවැත්වූ දිනයන්හිදී සහභාගී වූවන්ගේ අත්සන් ලේඛන නොමැතිව පවත්වාගෙන ගොස් තිබුණි. ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව බඳවා ගත් රියදුරන්6 දෙනා සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රථ වාහන පරීක්ෂකයෙකු පත් කර ගැනීමකින් තොරව බඳවා ගැනීමෙන් පසු ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා තිබුණි.	සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූවන්ගේ අත්සන් ලේඛනයක් රෝහලේ ලිපිගොනු තුළ නොමැති බව.	නිවැරදි ක්‍රමවේදය අනුව බඳවා ගැනීම් සිදු කල යුතුය.
(ඈ)	2020 ඔක්තෝබර් 26 දිනැතිඅංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය, 2024 ජුලි 26 දිනැති අංක 2394/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 2.3.1 හා 2.3.2	අමාත්‍යවරයාගේ නියෝගය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සිදු කර ඇති බවත් මෙම කරුණ සම්බන්ධව නව අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කොට	අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරු සඳහා බඳවාගැනීම් සිදු

වගන්තිය හා 2024 ජූලි 26 දිනැති අංක 05 දරන මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛයට පටහැනිව,මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සිදු කර තිබූ බඳවා ගැනීම,2024 ජූනි 28 දිනැති අංක 483.12.2 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් මෙතෙක් රෝහලේ වැටුප් ගෙවීම සඳහා අදාල කර ගන්නා ලද වැටුප් පරිමාණයන්ගෙන් බැහැරව රජයට අයත් ව්‍යවසායන් (SOE) සඳහා නිකුත් කර තිබූ 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල වැටුප් සංශෝධනය පදනම් කරගෙන 1996 ජූලි 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සියයට 35 ක දීමනාවක් වෛද්‍ය නොවන කාර්ය මණ්ඩලයට එකතු කර ගෙවීම හේතුවෙන් ඒ වන විට සේවයේ නිරතව සිටි සේවකයින් හා නවක සේවකයින් අතර වැටුප් විෂමතාවයක් ඇති වී තිබුණි.	අමාත්‍යවරයාගේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානය හා උපදෙස් සඳහා යොමුකර ඇති බව.	කිරීමේ දී වැටුප් පරිමාණ වෙනස් කිරීමේ දී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු අතර අදාල චක්‍රලේඛ වලට අනුගත විය යුතුය.

3.4 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.65,650,000 ක්වූ වාහන 8 ක් මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහන පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	භාවිතයට ගනු ලබන එම වාහන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුය.

4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 52 අතුරින් ක්‍රියාකාරකම් 29ක් ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් 23 අතුරින් ක්‍රියාකාරකම් 07 ක භෞතික ප්‍රගතිය සියයට 25හෝ ඊටවඩා අඩු මට්ටමක පැවතුණි.	පිළිතුරු ලබා දී නැත.	ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළයුතුය.